පසුගිය දිනක සිදුවූ රිය අනතුරක් සම්බන්ධයෙන් මාධ්‍ය මගින් පුවත් වාර්තාවන් ඉදිරිපත් කර තිබූ අතර, සමාජ මාධ්‍යයන් තුළද ඒ පිළිබඳව විශාල වශයෙන් කතාබහ අසන්නට ලැබිණි. මේ අතර දිවයින ඉරිදා සංග්‍රහය (11/22) ඔස්සේ ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වී තිබූ ලිපියක් පාඨකයෙකු විසින් Ethics Eye අවධානයට යොමු කොට තිබිණි.

"රටම කතාකළ 'පොලිස් දුවගේ' රිය අනතුර' යන සිරස්තලයෙන් යුතුව දැක්වුණු මෙම ලිපිය සමගින් ඡායාරූපයක් පළවී තිබූ අතර, එම ඡායාරූපය යටින් "අනතුර සිදුකළ තරුණිය හා ඇයගේ යෙහෙළිය" යනුවෙන්ද සඳහන්ව තිබිණි. මෙම ඡායාරූපයේ මුහුණු හඳුනාගත නොහැකි වන ලෙසින් බොඳ කර තිබුණි. කෙසේ වෙතත්, මෙවැනි ඡායාරූපයක් මෙම ලිපිය සමගින් පළ කිරීමේ අදාළත්වය කුමක්ද? එවැනි අදාළත්වයක් නොමැති නම්, මෙම ඡායාරූපය ලිපිය හා පළ කිරීමට වෙනත් හේතුවක් තිබෙන්නේද?

එසේම මෙම ලිපියේ එක් තැනක සඳහන් වූයේ, "...එම ජීප් රථය ඇයට ලබා දුන්නේ මුස්ලිම් මිතුරකු විසින් ය" යනුවෙනි. මෙම මිතුරාගේ වාර්ගිකත්වය එම සිදුවීමට අදාළ වන්නේද? එසේ අදාළ නොවන්නේ නම්, එම වාර්ගිකත්වය මුස්ලිම් ලෙසින් ලිපිය තුළට පැමිණෙන්නේ කුමන පදනමකින්ද? මාධ්‍ය ආචාර ධර්මයන්හිද පෙන්වා ඇති ආකාරයට, එසේ වාර්ගිකත්වය පුවතට සෘජුවම අදාළ නොවන විටක එය පළ කිරීම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවේද?

එම දිවයින ලිපියට ප්‍රවේශය මෙතැනින්: Divaina E-Paper (22 November 2020 - පිටුව 12)[http://epaper.divaina.com/](http://epaper.divaina.com/)

**#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina**